මහජන අදහස් විමසීම සඳහා කෙටුම්පත

## පෞද්ගලික මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානවල කටයුතු විධිමත් කිරීම සඳහා වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ සාදනු ලබන නියෝග කෙටුම්පත

1. මෙම නියෝග මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථාන පවත්වා ගෙනයාම නියාමනය සඳහා වන නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.
2. මෙම නියෝගවල,
 'ආඥා පනත' යන්නෙන් (469 වැනි අධිකාරිය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත අදහස් වේ.
 'අධ්‍යක්ෂ ජනරාල්' යනුවෙන් වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් කෙරේ.
 'මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය' යන්නෙන්, අනාරක්ෂිතව පවතින මුහුදු කැස්බෑවන් ගේ ස්වභාවික බිත්තර කැදැළිවලින් එම බිත්තර ඉවත්කර, කෘත්‍රිමව සකස් කරන ලද කැදැළි තුළ ආරක්ෂා සහිතව රැකීම සිදුකර, බිහිවන පැටවුන් මුහුදට නිදහස්කර හැරීම සඳහා, ශ්‍රී ලංකාවෙහි වෙරළාශ්‍රිතව පෞද්ගලිකව පවත්වාගෙන යනු ලබන කිසියම් ස්ථානයක් අදහස් කෙරේ.
 'ස්ථානීය සංරක්ෂණ කලාපය' යන්නෙන් වෙරළෙහි පවතින ස්වභාවික මුහුදු කැස්බෑ බිත්තර කැදැළි, ඒ ආකාරයෙන්ම තිබිය දී ආරක්ෂා කරනු ලබන වෙරළ කලාපය අදහස් කෙරේ.

3. ශ්‍රී ලංකාවේ වෙරළාශ්‍රිතව පවත්වා ගෙන යන පෞද්ගලික මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානවල කටයුතු විධිමත් කිරීම මෙම නියෝගයෙහි අරමුණ වන්නේ ය.

4. පෞද්ගලික මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථාන පවත්වාගෙන යාමේ ප්‍රධාන අරමුණ විය යුත්තේ වඳවීමේ තර්ජනයට ලක් ව ඇති ශ්‍රී ලංකාවේ වෙරළ තීරයට පැමිණෙන සියලු ම කැස්බෑ විශේෂවල දීර්ඝකාලීන සංරක්ෂණය තහවුරු කිරීම වන අතර, එම මධ්‍යස්ථානවල ක්‍රියාකාරකම් එම අරමුණ අනුව, විධිමත්ව පවත්වාගෙන යාමට සකස් කර ඇති මෙම නියෝගයන්ට අනුකූල ව කටයුතු කිරීමට සියලු පෞද්ගලික මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථාන පවත්වාගෙන යන තැනැත්තන් විසින් ක්‍රියා කළ යුතු ය.

5. මුහුදු කැස්බෑ විශේෂයන්ගේ සංරක්ෂණය තහවුරු කෙරෙන අතරම මුහුදු කැස්බෑවන්ගේ සංරක්ෂණයේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් මහජනතාව හා සෙසු පාර්ශවයන් දැනුවත් කිරීම හා ඔවුන් සතු දැනුම වැඩි දියුණු කිරීම සඳහා වූ පහත වැඩසටහන් ද ක්‍රියාත්මක කිරීමට සෑම මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක්ම පවත්වාගෙන යන තැනැත්තන් කටයුතු කළ යුතු ය.

 (අ). මුහුදු කැස්බෑවන් හා එම සතුන්ගේ සංරක්ෂණය පිළිබඳ දැනුම හා තොරතුරු මහජනතාව වෙත ලබා දෙන තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යා යුතුය.

 (ආ). මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයේ අරමුණු හා ක්‍රියාකාරකම් සම්බන්ධ ව දැනුවත් කිරීමේ පුවරු හා ඡායාරූප එහි ප්‍රදර්ශනය කළ යුතු ය.

 (ආ). මුහුදු කැස්බෑවන් ගේ ජීව විද්‍යාත්මක තොරතුරු, අදාල නීතිමය තත්වයන් හා සංරක්ෂණ ක්‍රියාදාමයන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ සුදුසු විවරණ ක්‍රියාවලියක් ද ක්‍රියාත්මක කළ යුතුය.

6. අධ්‍යක්ෂ ජනරාල්වරයා එම මුහුදු කැස්බෑවන් සංරක්ෂණය කිරීමේ අරමුණ ඇතිව පවත්වාගෙන යනු ලබන එම එක් එක් මධ්‍යස්ථානය ලියාපදිංචි කරනු ලැබීම සඳහා ද, එම එක් එක් මධ්‍යස්ථානය

සම්බන්ධයෙන් වාර්ෂික බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ද, එවැනි ලියාපදිංචියක් හා වාර්ෂික බලපත්‍රයක් ලබා ගැනීම සඳහා සහ ඉල්ලුම් කරනු ලැබිය යුතු වූ ද, බලය ඇත්තා වූ ද, නියමිත නිලධරයා විය යුතුය.

7. මෙම නියෝග යටතේ මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම අයදුම් පතක්ම මෙහි උපලේඛනයේ දැක්වෙන 'අ' ආකෘතියෙහි විය යුතුය.

8. මෙම නියෝග යටතේ මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා වාර්ෂික බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ සෑම අයදුම් පතක්ම මෙහි උපලේඛනයේ දැක්වෙන 'ආ' ආකෘතියෙහි විය යුතුය.

9. (1) මෙම නියෝග යටතේ යම් මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීම සඳහා ගාස්තුව රුපියල් පනස් දහසක් විය යුතුය.

(2) මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් සෑම ලියාපදිංචි කිරීමක්ම මෙහි උපලේඛනයෙහි සඳහන් 'ඇ' ආකෘතියෙහි විය යුතු වන අතර එහි අඩංගු කොන්දේසිවලට එය යටත් විය යුතුය.

10. (1) මෙම නියෝග යටතේ මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා හෝ වාර්ෂිකව එම බලපත්‍රය අලුත් කිරීම සඳහා ගාස්තුව රුපියල් විසිපන් දහසක් විය යුතුය.

(2) සෑම වාර්ෂික බලපත්‍රයක්ම මෙහි උපලේඛනයේ සඳහන් 'ඈ' ආකෘතියෙහි විය යුතුවන අතර, එහි අඩංගු කොන්දේසිවලට එය යටත් විය යුතුය.

(3) සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරනු ලැබුවේ යම් වර්ෂයක් වෙනුවෙන් ද, එය වලංගු කාලය එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතුය.

(4) බලපත්‍රයක් නියමිත නිලධරයා විසින් එහි අලුත් කිරීමේ සටහනක් තැබීමෙන් අලුත් කරනු ලැබිය හැකිය.

(5) මෙම නියෝග යටතේ වාර්ෂික බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තෙකු වෙත ද ඒ සෑම තැනැත්තෙකුම එම මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය විකුණා හෝ පවරා හෝ අන් ආකාරයකින් බැහැර කර ඇත්නම් මිස, එකී බලපත්‍රයෙහි වලංගු කාලය අවසන් වන දිනට එක් මසකට පෙර එම බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලීමක් කළ යුතු වේ. බලපත්‍රය අවසන් වන දිනට මසකට පෙර එම බලපත්‍රය අලුත් කිරීමට ඉල්ලුම් නොකරන අවස්ථාවක, එසේ අලුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට ප්‍රමාද වන සෑම මාසයක් සඳහාම රුපියල් දෙදහසක දඩයක් ගෙවීමට බලපත්‍රධාරියා යටත් විය යුතුය. වසරක ප්‍රමාදයකින් පසුව වාර්ෂික බලපත්‍රයක් නැවත අලුත් කිරීම සඳහා සලකා බලනු නොලැබේ.

(6) වාර්ෂික බලපත්‍රයක් වලංගු කාලය දිගු කිරීම සඳහා ඉල්ලුම් කරන සෑම අවස්ථාවක දීම මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයේ රඳවා සිටින සතුන් යහපත් සෞඛ්‍ය හා පෝෂණ තත්වයේ සිටින බව සනාථ කිරීම සඳහා පශු වෛද්‍ය වාර්තාවක් ද ඉදිරිපත් කළ යුතුය.

11. අවස්ථාවෝචිත පරිදි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධරයකු, පොලිස් නිලධරයකු, අදාල ප්‍රාදේශීය ලේකම්වරයා හෝ ග්‍රාම සේවා නිලධරයා විසින් පරීක්ෂා කිරීම සඳහා වාර්ෂික බලපත්‍රය හෝ ලියාපදිංචි සහතිකය ඉල්ලා සිටින කිනම් අවස්ථාවක වුව ද එය ඉදිරිපත් කළ යුතුය.

12. යම් මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක් තව දුරටත් පවත්වාගෙන යාම අවසන් කරන අවස්ථාවක, එම මධ්‍යස්ථානය සන්තකව සිටි හෝ භාරව සිටි තැනැත්තා විසින් ඒ පිළිබඳව නියමිත නිලධරයා වෙත එසේ අවසන් කරන ලද දින සිට සති දෙකක් ඇතුළත දැනුම් දෙනු ලැබිය යුතුය. එවැනි

මධ්‍යස්ථානයක් නැවත ආරම්භ කරන අවස්ථාවක, එසේ නැවත ආරම්භ කිරීම පිළිබඳව ද නියමිත නිලධරයා වෙත වහාම දැනුම් දිය යුතුය.

13. (1) විකිණීමකින්, පූර්ව අයිතිකරුගේ මරණයෙන් හෝ වෙනත් කුමන ආකාරයකින් හෝ වෙනත් යම් තැනැත්තෙකු මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක අයිතිකරුබවට පත්වන හෝ එම මධ්‍යස්ථානයේ භාරකරුබවට පත්වන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් පූර්ව අයිතිකරු වෙත නිකුත් කරන ලද වාර්ෂික බලපත්‍රය අවලංගු කරවා ගැනීම සඳහා එසේ අයිතිකරු බවට පත් වී මාසයක් ඇතුළත නියමිත නිලධරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය යුතුය.

(2) එම ඉල්ලීම, පූර්ව ලියාපදිංචි සහතිකය සහ වාර්ෂික බලපත්‍රය සමග ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

(3) ඉල්ලුම්කරු නව අයිතිකරු බවට සෑහීමකට පත්වීමෙන් පසුව, නියමිත නිලධරයා විසින් එම ලියාපදිංචිය සහ වාර්ෂික බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතුය.

14. (1) එම ලියාපදිංචිය අවලංගු කිරීමෙන් පසු, නව අයිතිකරු, මෙම නියෝගයෙහි 'ආ' ආකෘතියෙහි ප්‍රකාරව අලුත් ලියාපදිංචි කිරීමක් ලබා ගැනීමට ඉල්ලුම් කළ යුතුය.

(2) ඉල්ලුම්කරු නව අයිතිකරු බවට සෑහීමකට පත්වීමෙන් පසු, නියමිත නිලධරයා එම අයිතිකරුගේ නමින් නව ලියා පදිංචි කිරීමක් සිදු කළ යුතුය.

15. (1) 12 වන නියෝගය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමෙන් පසු, නව අයිතිකරු මෙම නියෝගයෙහි උපලේඛනයෙහි 'අ' ආකෘතිය ප්‍රකාරව අලුත් වාර්ෂික බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කළ යුතුය.

(2) ඉල්ලුම්කරු නව අයිතිකරු බවට සෑහීමකට පත්වීමෙන් පසු, නියමිත නිලධරයා එම අයිතිකරුගේ නමින් නව වාර්ෂික බලපත්‍රයක් නිකුත් කළ යුතුය.

16. (1) මෙම නියෝගය අනුව මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක් ලියා පදිංචි කිරීම හෝ එවැනි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා වාර්ෂික බලපත්‍රයක් ලබා ගැනීම හෝ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පතක යම් ව්‍යාජ තොරතුරක් සපයන සෑම තැනැත්තෙක් ම වරදකට වරද කරුවෙකු වේ.

(2) මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක අයිතිකරු හෝ එවැනි මධ්‍යස්ථානයක වෙනත් යම් තැනැත්තෙකු ආඥා පනතේ විධි විධානයන්ට පටහැනිව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් වාර්තා වූ අවස්ථාවක ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් මූලික විමර්ශනයක් සිදුකර එහි නිර්දේශය අනුව ලියාපදිංචිය හා වාර්ෂික බලපත්‍රය අහෝසි කිරීමට හා ආඥා පනතේ නීතිමය ප්‍රතිපාදනයන්ට අනුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබිය හැකි ය.

17. මෙම නියෝගය යටතේ අයකර ගනු ලබන සියලුම ලියාපදිංචි කිරීමේ ගාස්තු හා වාර්ෂික බලපත්‍ර ගාස්තු ආඥා පනත යටතේ පිහිටුවා ඇති වනජීවී සංරක්ෂණ අරමුදලට බැරකළ යුතුය.

**උප ලේඛනය**

**'අ' ආකෘතිය**

**වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත**

**මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක්**
**ලියාපදිංචි කිරීම සඳහා අයදුම් පත්‍රය**

.............................................. ලිපිනයේ පදිංචි ........................................................... වන මම පහත විස්තර දැක්වෙන මුහුදු කැස්බෑවන් සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය මට අයත් / මගේ භාරයේ පවතින බව මෙයින් ප්‍රකාශ කර සිටින අතර එය සනාථ කිරීම සඳහා පහත සඳහන් තොරතුරු සහ ලියකියවිලි ඉදිරිපත් කරමි.
ඒ අනුව එම මුහුදු කැස්බෑවන් සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය ලියාපදිංචි කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

1. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයේ නම -
   ...............................................................................

   පිහිටා ඇති ලිපිනය - ..........................................................
   දිස්ත්‍රික්කය - .................................
   ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - .....................................
   ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාශය - .............................................
   දුරකතන අංකය - .................
   විද්‍යුත් ලිපිනය - ..........................................................

2. අයදුම්කරු මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයේ හිමිකරු නොවන්නේ නම් නීත්‍යානුකූල හිමිකරුගේ නම - .....................................................................
   ලිපිනය - .......................................................
   දුරකතන අංකය - ......................................

3. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය පිහිටා ඇති ඉඩමේ වපසරිය - හෙක්ටයාර ....................

   ඉඩමේ වෙරළට මුහුණ ලා ඇති දිග - මීටර .................

   මුහුදු ජල තීරය දක්වා දුර - මීටර ............

4. පවතින පහසුකම් -

   කෘත්‍රිම මුහුදු කැස්බෑ කැදලි සකස් කිරීම සඳහා වෙන්කර ඇති ඉඩ - වර්ග අඩි .................
   කැස්බෑ පැටවුන් රඳවන ජල ටැංකි පරිමාව - ලීටර ............................
   තොරතුරු මධ්‍යස්ථානය - වර්ග අඩි .............................

5. සේවයෙහි යොදවා ඇති සේවකයින් සංඛ්‍යාව -
   ස්ථිර ...................... තාවකාලික / අනියම් - ......................

6. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයේ නීත්‍යානුකූල අයිතිය / භාරකාරත්වය සනාථ කිරීම සඳහා අමුණා ඉදිරිපත් කරනු ලබන ලිපි, ලේඛන
   (1) .........................................
   (2) .........................................
   (3) .........................................

7. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයේ රඳවා සිටින මුහුදු කැස්බෑවන් ගේ සෞඛ්‍යය හා පෝෂණය පිළිබඳව නිරන්තරව පරීක්ෂා කිරීමට පත්කර ඇති පශු වෛද්‍යවරයා පිළිබඳ තොරතුරු
   (1) වෛද්‍යවරයාගේ නම .......................................................
   (2) ලියා පදිංචි අංකය ..................................................
   (3) ලිපිනය ....................................................

(වෛද්‍යවරයාගේ කැමැත්ත ප්‍රකාශ කෙරෙන ලිපියක් අමුණන්න)

ඉහත සඳහන් සියලුතොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් ප්‍රකාශ කරමි. ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීමට සුදුසු බවට සනාථකර, නියමිත ගාස්තුව වන රුපියල් පනස් දහස ගෙවා ලියාපදිංචිය ලබා ගැනීමට ද මෙයින් එකඟතාවය පල කරමි.

දිනය - .............................. ............................................
ඉල්ලුම්කරුගේ අත්සන

**(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)**

1. ඉහත විස්තර සඳහන් ............................................. ලිපිනයේ .......................................... නමැති මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය .................................. දින ක්ෂේත්‍ර පරීක්ෂාවට ලක් කරන ලදි. දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වාගෙන යන බව නිරීක්ෂණය කරන / නොකරන ලදි. ලියාපදිංචි කිරීම අනුමත කරමි / නොකරමි.

   දිනය - ............................. ..........................................
   ක්ෂේත්‍ර පරීක්ෂාව සිදුකළ
   වනජීවී අඩවි ආරක්ෂක ගේ අත්සන
   හා නිල මුද්‍රාව

2. ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී නියමිත මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වාගෙන යනු ලබන බවට සනාථ කර, ලියා පදිංචි ගාස්තුව රුපියල් පනස් දහසක් ගෙවා ඇත. (මුදල් කුවිතාන්සි අංකය - ........................................ දිනය - ...........................................)
   ඉහත 1 හි සඳහන් මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීමට නිර්දේශ කරමි.

   දිනය - ............................. ..........................................
   කලාපය භාර සහකාර අධ්‍යක්ෂ

3. ඉහත විස්තර සඳහන් මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය අංක .................................. යටතේ ලියාපදිංචි කිරීම අනුමත කරමි.

   දිනය - ........................... ...............................................
   වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්

**'ආ' ආකෘතිය**

**වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත**

**මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට**
**වාර්ෂික බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ අයදුම් පත්‍රය**

1. අයදුම්කරුගේ නම - ..................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය - ...............................................

3. දුර කතන අංකය - ...........................

4. ලිපිනය - ..............................................................................................

5. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයේ නම - ...............................................

6. ලියාපදිංචි අංකය - ................................................ දිනය - .............................

7. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයේ ලිපිනය - ........................................

8. ගෙවන ලද බලපත්‍ර ගාස්තුව - රු ..............................................

9. මුදල් කුවිතාන්සි අංකය - .................................. දිනය - ..............................

10. බලපත්‍රය වලංගු කාලය - ............................. සිට - ................................ දක්වා

ඉහත මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයේ නීත්‍යානුකූල හිමිකරු / භාරකරු මම වෙමි. වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ නීතිමය ප්‍රතිපාදනයන්ට හා ඒ යටතේ නිකුත් කර ඇති අදාල නියෝගයන්ට යටත්ව සහ බලපත්‍රයේ හා ලියාපදිංචි සහතිකයේ සඳහන් කොන්දේසිවලට සහ ලබා දී ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට මෙයින් එකඟතාවය පළ කරමි.

දිනය - ........................... ..........................................
අයදුම්කරුගේ අත්සන

**(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)**

1. ඉහත මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය නිසි පරිදි ලියාපදිංචි කර ඇත. බලපත්‍රය නිකුත් කිරීම නිර්දේශ කරමි

   දිනය - .................................... ............................................
   කලාපය භාර සහකාර අධ්‍යක්ෂ

2. ඉහත බලපත්‍රය නිකුත් කිරීම අනුමත කරමි.

දිනය - ....................................                    ...........................................
වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්

**'ඇ' ආකෘතිය**

**වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත**

**මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක්**
**ලියාපදිංචි කිරීම සඳහා වූ සහතිකය**

1. ලියාපදිංචි අංකය - ..............................................
2. ලියාපදිංචි කළ දිනය - ...........................................
3. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයේ නම - ........................................................................
4. ලිපිනය - ........................................................................................................................
5. පිහිටීම -
   දිස්ත්‍රික්කය - ..............................
   ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - ................................
   ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාශය - ...................................................
6. නීත්‍යානුකූල හිමිකරුගේ නම - ..........................................................................
   ලිපිනය - ...................................................
7. භාරකරුගේ නම - ............................................................................................
   ලිපිනය - .........................................................................................
8. ගෙවන ලද ලියාපදිංචි ගාස්තුව - රු. ................................
   (මුදල් කුවිතාන්සි අංකය - ..................................... දිනය - ..............................................)

මෙම මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීමේ සහතිකය, වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ විධිවිධානයන්ට ද, එය යටතේ සාදන ලද නියෝගයන්ට ද, මෙහි පිටුපස දක්වා ඇති කොන්දේසිවලට ද යටත්ව නිකුත් කරන ලදි.

දිනය - .......................................                    ...............................................
වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්

**කොන්දේසි**

1. මෙම ලියාපදිංචි කිරීමේ සහතිකය අන්සතු කළ නොහැකිය.
2. ලියාපදිංචි කිරිමේ සහතිකය නිකුත් කරන ලද්දේ යම් තැනැත්තෙකුට ද, ඒ තැනැත්තා විසින් ලියාපදිංචි සහතිකය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු, පොලිස් නිලධරයකු,

අදාල ප්‍රාදේශීය ලේකම්වරයා හෝ ග්‍රාමසේවා නිලධාරියා විසින් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටින කිනම් අවස්ථාවක වුව ද එය ඉදිරිපත් කළ යුතුය.

3. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය තව දුරටත් පවත්වාගෙන යාම අත්හිටුවා වසා දැමීමට තීරණය කළ අවස්ථාවක හෝ ලියාපදිංචි කිරීමේ සහතිකය අස්ථානගත වූ අවස්ථාවක, ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරන ලද්දේ යම් තැනැත්තෙකු විසින් ද, එම තැනැත්තා විසින් දෙසතියක් ඇතුළත ඒ බැව් වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දිය යුතුය.
4. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය වෙරළට මායිම් වන ඉඩමක පවත්වා ගෙන යා යුතු ය.
5. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයේ සිට දෙපසටම ඊට යාබදව පවතින, වෙරළ තීරයේ අවම වශයෙන් මීටර් 500 ක ප්‍රදේශයක මුහුදු කැස්බෑවන්ගේ ස්ථානීය සංරක්ෂණය සිදුකිරීමට කටයුතු කළ යුතු ය. එනම් එම සීමාව තුළ වෙරළේ ඇති ස්වභාවික මුහුදු කැස්බෑ බිත්තර කැදළි එම ස්ථානයේ තිබිය දී ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන මාර්ගෝපදේශයන්ට අනුකූලව ආරක්ෂා කළ යුතු ය.
6. ස්ථානීය සංරක්ෂණ කලාපයෙන් පරිබාහිර ස්වභාවික මුහුදු කැස්බෑ බිත්තර කැදළිවලින් බිත්තර ඉවත් කිරීමේ දී  බිත්තර දැමීමට පැමිණෙන මුහුදු කැස්බෑවන්ට හිරිහැර නොවන පරිදි, බිත්තර දැමීම අවසන් වී හැකි ඉක්මනින් පැය 03 ක් ඉක්ම යාමට පෙර ලබාගෙන, එම  බිත්තරවල මතුපිට වියලී යාමට පෙර ආසන්නයෙන් ම පිහිටි සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයට වෙත රැගෙනවිත් කෘත්‍රිම කැදළි තුළ ලබා දී  ඇති මාර්ගෝපදේශයන්හි නිර්දේශිත ආකාරයට තැන්පත් කළ යුතුය.
7. ස්වභාවික කැදළිවලින් බිත්තර ලබා ගැනීම, ප්‍රවාහනය හා සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයේ කෘත්‍රිම කැදළි තුළ තැන්පත් කර පැටවුන් බිහිවන තෙක් රැකබලා ගැනීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කළ යුතුය.
8. කෘත්‍රිම කැදළිවල තැන්පත් කරනු ලබන කැස්බෑ බිත්තර සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් ලිඛිත වාර්තාවක් සෑම මධ්‍යස්ථානයක ම දෛනිකව පවත්වාගෙන යා යුතු වන අතර එම කැදළිවලින් බිහිවන මුහුදු කැස්බෑ පැටවුන්ගේ විස්තර සහිත ලේඛනයක් ද පවත්වාගෙන යා යුතු ය. එම තොරතුරු හා දත්ත වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන උපදෙස් හා ආකෘතිවලට අනුකූල ව මාසික හා වාර්ෂික වාර්තාවන් මගින් එම තොරතුරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.
9. කෘත්‍රිම කැදළි , මුහුදු ජල තීරයේ සිට මීටර් 30ක් ඇතුළත මධ්‍යස්ථානය තුළ ආරක්ෂිත ස්ථානයක සකස් කළ යුතුවන අතර බිත්තර කැදළි දෙකක් අතර දුර අවම වශයෙන් මීටර් 1.2 ක් විය යුතු ය. එමෙන් ම හැකි සෑම අවස්ථාවක දී ම මුහුදු කැස්බෑ බිත්තර ලබාගන්නා ලද ස්ථානයේ තිබූ පරිසර තත්ත්වලට සමාන පරිසර තත්ත්ව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු ය.
10. කෘත්‍රිම මුහුදු කැස්බෑ බිත්තර කැදළිවලින් බිහි වී පිටතට පැමිණෙන මුහුදු  කැස්බෑ පැටවුන්ට මුහුදු වෙරළ මතින් බාධාවකින් තොරව මුහුදු ජල සීමාව වෙත ළඟා වීමට කටයුතු සලසා තිබිය යුතු ය. එසේ වුව ද ආබාධිත හෝ වෙනත් පුනරුත්ථාපනය සඳහා රඳවා ගතයුතු යයි හැඟෙන සතුන් පිළිබඳව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ නිලධාරියා වෙත වාර්තා කර එම සතුන් දෙපාර්තමේන්තුව භාරයට පත් කළ යුතු ය.
11. මුහුදු කැස්බෑ බිත්තර එකතු කර මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය වෙත සපයන පුද්ගලයින් පිළිබඳ විස්තර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ලබාදිය යුතු අතර, ඔවුන් ස්ථානීය සංරක්ෂණ කලාපයට පිටතින් පමණක් බිත්තර ලබා ගන්නා බවට වගබලා ගත යුතු ය.
12. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයේ කෘත්‍රිම බිත්තර කැදළි සකස් කරන ස්ථානය,
    i. මුහුදු ජලය හෝ වෙනත් ගොඩබිම් ජලය මගින් යට නොවන ස්ථානයක් විය යුතුවන අතර, විලෝපික සතුන්ට ළඟාවිය නොහැකි පරිදි ආරක්ෂිත වැටක් යොදා තිබිය යුතු ය.. එම ස්ථානය වටා මීටර් 0.5 ක් පමණ ගැඹුරට කුඩා සිදුරු සහිත කම්බි දැලක් යොදා කකුළුවන් ඇතුළු අනෙකුත් භෞමික විලෝපිකයන්ට ද ඇතුළුවිය නොහැකි වන පරිදි සකස් කළ යුතු ය.
    ii. එම ස්ථානයට ඉහලින් වහලයක් හෝ වෙනත් කිසිදු කෘත්‍රිම ආවරණයක් නොයොදා විවෘතව තැබිය යුතු ය.
    iii. එහි කිසිදු බාහිර පුද්ගලයකුට ඇතුළුවීමට හෝ බිහිවන මුහුදු කැස්බෑ පැටවුන් අතින් ඇල්ලීමට ඉඩ නොදිය යුතුය.

iv. මීටර් 01 ක් පොළව යටට ඇති සියලු ම ජීවී හා අජීවී ශාක ද්‍රව්‍ය ඉවත් කර, පිරිසිදු වැලි පුරවා සකස්කර පවත්වාගෙන යා යුතු ය.

v. එක් එක් මුහුදු කැස්බෑ විශේෂයේ බිත්තර දැමීම සඳහා වෙන් වෙන් ස්ථාන පවත්වාගෙන යාම සිදු කළ හැකි සෑම අවස්ථාවක දී ම එසේ සිදු කළ යුතු ය. බිත්තර වළලන ස්ථානය සෑම මාස හයකට වරක් ම වෙනත් ස්ථානයකට මාරු කළ යුතු ය.

vi. බිත්තර කැදළිවලින් බිහිවන කැස්බෑ පැටවුන්ට පීඩාකාරී වන කැමරා ආලෝකය ඇතුළු කිසිදු කෘත්‍රිම ආලෝකයක් එම ස්ථානවල හා ඒ ආසන්නයේ භාවිත නොකළ යුතු ය.

13. මුහුදු කැස්බෑ බිත්තර වළලා ඇති එක් එක් බිත්තර කැදැල්ලෙහි අනුපිළිවෙලින් අංකය සඳහන් කුඩා පුවරුවක් යොදා, එහි බිත්තර ගොඩගත් ස්ථානය, බිත්තර ප්‍රමාණය, බිත්තර වළලන ලද දිනය හා වේලාව, විශේෂය ආදී විස්තර සඳහන් කළ යුතු ය. එම අනු අංකයට අදාළ ව නියමිත ලේඛනවල ද එම විස්තර සටහන් කර තිබිය යුතු ය.

14. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක, දාර කැස්බෑවන් හැර අනෙක් විශේෂයන්ට අයත්, රඳවාගත හැකි උපරිම සුහුඹුල් මුහුදු කැස්බෑවන් සංඛ්‍යාව 8 ක් විය යුතු අතර එක් විශේෂයකින් රඳවාගනු ලබන සංඛ්‍යාව 2 කට වැඩි නොවිය යුතු ය. දාර කැස්බෑවන් රඳවා තබාගැනීම සපුරා තහනම් වේ.

15. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක රඳවා තබාගන්නා සෑම කැස්බෑවකු ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු ය. එමෙන්ම මධ්‍යස්ථානයේ රඳවා තබාගන්නා කැස්බෑවකු මිය ගිය හොත් දෙපාර්තමේන්තුවට දන්වා පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදු කළ යුතු ය.

16. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය භාරයේ රඳවා තබාගන්නා කැස්බෑවන් එහි අනිසි කළමනාකරණය හේතුවෙන් නිරන්තරයෙන් මරණයට පත් වන බව තහවුරුවන අවස්ථාවල දී ලියාපදිංචිය හා බලපත්‍රය අවලංගු කිරීමට නියමිත නිලධාරියා විසින් කටයුතු කළ යුතුය

17. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානවල කැස්බෑ පැටවුන් රඳවා තබන ජල ටැංකි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයන්ට අනුකූල ව නියමිත හැඩයට හා පරිමාවට සකස් කර ඒවායේ ජලයේ පිරිසිදුභාවය හා ගුණාත්මක භාවය පිළිබඳ ව (ලවණතාවය හා pH අගය) නිරන්තරව විපරම් කරමින් පවත්වාගෙන යා යුතුය.

18. සෑම මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක්ම මුහුදු කැස්බෑවන් සංරක්ෂණය පිළිබඳ තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියාත්මක විය යුතුවන අතර ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ වෙන්කළ යුතුය. මුහුදු කැස්බෑවන් ගේ ජීව විද්‍යාත්මක තොරතුරු, අදාල නීතිමය තත්වයන් හා සංරක්ෂණ ක්‍රියාදාමයන් පිළිබඳ දැනුවත් කිරීමේ පුවරු හා ඡායාරූප එහි ප්‍රදර්ශණය කළ යුතුවන අතර සුදුසු විවරණ ක්‍රියාවලියක් ද ක්‍රියාත්මක කළ යුතුය.

19. එහි මුහුදු කැස්බෑවන්ගේ හෝ වෙනත් කිසිදු ආරක්ෂිත සත්ත්ව විශේෂයක නිදර්ශක හෝ සත්ව කොටස් හෝ එවැනි කොටස් ඇතුළත් භාණ්ඩ විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශණය කිරීම නොකළ යුතු ය.

20. ලියාපදිංචි කරන ලද සෑම මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක ම වාර්ෂික බලපත්‍රය හිමි තැනැත්තා එම මධ්‍යස්ථානයේ කළමනාකරණය සම්බන්ධ සියලු වගකීම් සම්පූර්ණයෙන් දැරිය යුතුවන අතර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන මාර්ගෝපදේශයන්ට අනුකූලව එම කළමනාකරණ කටයුතු සිදුකළ යුතුය.

21. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානවල කටයුතු නියමිත නිලධාරියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරීන් විසින් අධීක්ෂණය කරනු ලබන අතර එම ස්ථාන වැඩි දියුණු කිරීම් සම්බන්ධයෙන් යෝජිත විශේෂ ව්‍යාපෘති වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජෙනරාල් වෙත ඉදිරිපත් කර ඒ සඳහා පූර්ව අනුමැතිය ලබාගත යුතු ය.

22. නියමිත නිලධාරියාට හෝ වෙනත් යම් වනජීවී සංරක්ෂණ නිලධාරියෙකුට ඕනෑ ම අවස්ථාවක දී මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයට කිසිදු බාධාවකින් තොර ව ඇතුළු වී එහි කටයුතු අධීක්ෂණය කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීමට එම මධ්‍යස්ථාවල කළමණාකාරිත්වය විසින් ඉඩ සලසා දිය යුතු ය.

**'ඇ' ආකෘතිය**

**වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත**

**මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා වූ වාර්ෂික බලපත්‍රය**

1. බලපත්‍ර අංකය - .......................... නිකුත් කළ දිනය - ....................................
2. බලපත්‍රය හිමි තැනැත්තා ගේ නම - ..........................................................
3. ලිපිනය - ..........................................................................................
4. ජාතික හැඳුනුම්පත් අංකය - .................................................
5. අදාල මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයේ නම - ...............................................
   ලිපිනය - ...........................................................................
   දිස්ත්‍රික්කය - ..................................
   ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - ..................................
   අදාල ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාශය - ............................
   ලියාපදිංචි අංකය - ......................
   ලියාපදිංචි කළ දිනය - ...........................
6. ගෙවන ලද වාර්ෂික බලපත්‍ර ගාස්තුව - රු. ..................... මුදල් කුවිතාන්සි අංකය - ...................
7. බලපත්‍රය වලංගු කාලය - ....................................... සිට ................................... දක්වා

මෙම මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා වූ වාර්ෂික බලපත්‍රය , වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ විධිවිධානයන්ට ද, එය යටතේ සාදන ලද නියෝගයන්ට ද, මෙහි පිටුපස දක්වා ඇති කොන්දේසිවලට ද යටත්ව නිකුත් කරන ලදී.

දිනය - ......................................

.............................................
වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්

**කොන්දේසි**

1. මෙම වාර්ෂික බලපත්‍රය අන්සතු කළ නොහැකිය.
2. වාර්ෂික බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් තැනැත්තෙකුට ද, ඒ තැනැත්තා විසින් වාර්ෂික බලපත්‍රය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු, පොලිස් නිලධරයකු, අදාල ප්‍රාදේශීය ලේකම්වරයා හෝ ග්‍රාමසේවා නිලධාරියා විසින් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටින කිනම් අවස්ථාවක වුව ද එය ඉදිරිපත් කළ යුතුය.
3. මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය තව දුරටත් පවත්වාගෙන යාම අත්හිටුවා වසා දැමීමට තීරණය කළ අවස්ථාවක හෝ වාර්ෂික බලපත්‍රය අස්ථානගත වූ අවස්ථාවක, වාර්ෂික බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් තැනැත්තෙකු වෙත ද, එම තැනැත්තා විසින් දෙසතියක් ඇතුළත ඒ බැව් වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජෙනරාල් වෙත දැනුම් දිය යුතුය.
4. බලපත්‍රයේ වලංගු කාලය අවසන් වීමට මසකට පෙර, ඉදිරි වර්ෂය සඳහා බලපත්‍රයේ වලංගු කාලය දිගු කරවා ගැනීමට අදාල බලපත්‍ර ගාස්තු ගෙවා නිමිත නිලධරයා වෙත ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ යුතුය.
5. ලියාපදිංචි කරන ලද අදාල මුහුදු කැස්බෑ සංරක්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය, වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ විධිවිධානයන්ට ද, ඒ යටතේ සාදන ලද නියෝගයන්ට ද,

ලියාපදිංචි කිරීමේ සහතිකයේ කොන්දේසි හා මෙම වාර්ෂික බලපත්‍රයේ කොන්දේසිවලට ද, නිසි පරිදි කළමනාකරණය කිරීමේ වගකීම මෙම බලපත්‍ර හිමිකරු වෙත පැවරෙන අතර ඒ සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා දෙනු ලබන මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමට ද බැඳී සිටී.